**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**
**<u>මාතර දිස්ත්‍රික්කය.</u>**

**1. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට **කඹුරුපිටිය** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
----------------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කර නොතිබූ රු.10,558,317 ක්වූ ණයහිමියන් යටතේ ගෙවීම් නිවැරදි කිරීමට එම වටිනාකමින් ණයහිමියන්ට හර කිරීම නිසා ණයහිමි ශේෂය රු.21,116,634 ක් අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සභාවට අයත් අම්බලම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.87,108 ක විදුලි බිල්පත් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | සභා තීරණය පරිදි මහජන නියෝජිතයන් හා නිළධාරින්ගෙන් සමන්විත විශේෂ කමිටුවක් පත් කර එමගින් ලබා දෙන නිර්දේශ පදනම් කරගෙන කටයුතු කරමි. |
| (iii) | ඉකුත් වර්ෂයේදි රු.97,460 ක් වැය කර මිලදී ගත් ශබ්ද විකාශන උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු දේපල සංවර්ධනය කිරීමේදී වැයකරන ලද ප්‍රාග්ධන වියදම් රු.1,568,675 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිමි වැඩ වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ ගෙවා අවසන් කර ඇති වටිනාකම් ප්‍රාග්ධනිත කර ඇති අතර වෙනස සියයට දහය රඳවුම් මුදල වේ. |
| (v) | ඉකුත් වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.1,776,119 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 141,827,473 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 105,945,169 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරිමට කටයුතු කළ යුතු වේ. | දීර්ඝ කාලයක සිට ලේඛන තුලනය කිරීමේ ගැටළු පවතින අතර ලේඛන තුලනය කරමින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂවල සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින රු.1,168,845 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිරවුල් කිරිමට කටයුතු කළ යුතු වේ. | 2006 වර්ෂයේ සිට පැවතගෙන එන අතර එය නිවැරදි කිරීමට අදාල ලේඛන තොරතුරු නොමැත. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.108,713,194 ක් වූ ගිණුම් විෂයයන් 13 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි අදාළ ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන අතර දීර්ඝ කාලයක සිට පැවත එන ගැටළු නිරාකරණය කර ගනිමින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (ii) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව තුලනය කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර් ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 හා 2012 ජනවාරි 05 දිනැති චක්‍රලේඛය | ප්‍රජා පාදක සංවිධානවලට වැඩ කොන්ත්‍රාත් පැවරීමේදී යෝග්‍යතාවය පරීක්ෂා කිරීමකින් තොරව සමිති වෙත කර්මාන්තය ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,188,811 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,301,021ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,912,040 | 2,802,319 | 2,897,024 | 1,432,237 | 2,279,258 | 2,626,520 | 2,419,218 | 1,526,942 |
| කුලී | 13,987,800 | 8,042,270 | 7,833,020 | 1,216,748 | 7,334,109 | 6,726,806 | 7,373,009 | 1,007,498 |
| බලපත්‍ර ගාස්තු | 702,000 | 1,257,178 | 1,104,628 | 252,945 | 982,450 | 1,679,271 | 1,664,671 | 100,395 |
| වෙනත් ආදායම් | 30,557,224 | 49,460,000 | 52,485,479 | 31,572,543 | 6,730,000 | 26,713,512 | 11,857,099 | 34,598,022 |
| **එකතුව** | 48,159,064 | 61,561,767 | 64,320,151 | 34,474,473 | 17,325,817 | 37,746,109 | 23,313,997 | 37,232,857 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 1,199,595 ක් වූ අතර, රු.1,493,841 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමග රු.2,693,437 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.1,522,983 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,170,454 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2018 පෙබරවාරි 26 දින සිට වරිපනම් බිල් කිරීම් නතර කර ඇති අතර වසර ගණනාවක සිට අය වීමට ඇති රු.140,660 ක් වන හිඟ මුදල ලේඛන වලින් කපා හැරීම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.327,347 ක් වූ අතර රු.23,988 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.351,335 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම19,899 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.331,436 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවන් මගින් හඳුනාගත් ඉඩම් කැබලි බවට පත් වූ පසු අක්කර බදු හිමිකරුවන්ගේ නම් ආදායම් ලේඛනයෙන් ඉවත් කිරීමට මහා සභාවට ඉදිරිපත් කර ඇති අතර තවදුරටත් හිඟ අයකර ගැනීමටත් ඉඩම් පිළිබඳව නිවැරදි දත්ත හඳුනා ගැනීමටත් කටයුතු කරමින් පවතී. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **කඩ කුලී** | | |
| ආරම්භක හිඟය රු.1,002,739 ක් වූ අතර, රු.8,162,891 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමග රු.9,165,630 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.8,146,486 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.1,0189,144 ක් හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා සමථ මණ්ඩලයේ නඩු පැවරීම, සිහි කැඳවීම් ලිපි යැවීම, ක්ෂේත්‍රයේ මුදල් අය කිරීම ආදී කටයුතු සිදුකිරීමට නියමිතය. නඩු තීන්දු අනුව දීර්ඝ කාලීනව කොටස් වශයෙන් අය කරන හිඟ මුදල් මෙම හිඟ ශේෂය තුළට ඇතුළත් වී ඇත. |

**2.2.4 වෙනත් ආදායම්**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.1,309,037 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.28,182,574ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ මුදල් ලබා ගැනීම සඳහා අදාල ආයතන වෙතින් ඉල්ලීම් කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| සභාව විසින් දෛනිකව එක්රැස් කරන කසළ වර්ගීකරණයකින් තොරව කඹුරුපිටිය නගරයේ පොළ පිටුපස පිහිටි ඉඩමට අවිධිමත් ලෙස බැහැර කරමින් පැවතුණි. | විධිමත් ලෙස කසළ බැහැර කළ යුතු වේ. | සුදුසු භූමියක් අත්පත් කර ගැනීමෙන් අනතුරුව දැනට කසළ බැහැර කරන ස්ථානය ඉවත් කර ගැනීමට කටයුතු කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 49 හා 52 වගන්තිය ප්‍රකාර 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අනවසර ඉදිකිරීම් 53 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අනවසර ඉදිකිරීම් සම්බන්ධ ලේඛනය විධිමත් කිරීමටත් ඒ අනුව අනවසර ඉදි කිරීම් පරික්ෂා කිරීමට හා ඒවා ඉවත් කිරීමට අදාළව විධිමත් වැඩ පිළිවෙළක් |

| | | | |
|---|---|---|---|
| | | | ඉදිරියේදී සකස් කිරීම සඳහා කටයුතු කරමි. |
| (ආ) | අනවසරයෙන් පවත්වා ගෙන යන මැටි ගඩොල් ව්‍යාපාර 167 ක් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මකව පැවති අතර එම ව්‍යාපාර මගින් පරිසරයට වන හානිය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | පරිසරයට හානිදායක ව්‍යාපාර පවත්වාගෙන නොයැමට සභාව කටයුතු කළ යුතු වේ. | කහගල ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වශයෙන් පවත්වාගෙන යනු ලබන මැටි ගඩොල් කර්මාන්තයෙන් ඇති වන පරිසර බලපෑම පිළිබඳව විමසා බැලීම ප්‍රාදේශිය සභාවට තනිව සිදුකළ හැකි කටයුත්තක් නොවේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------------------- |
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>---------------------------------<br>අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 12 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 04 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු සහ අතිරික්ත විධිමත් කළ යුතු වේ. | ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර හැර අනෙකුත් අතිරික්ත තනතුරු සියල්ල සඳහා මු.රෙ. 71 ප්‍රකාරව කටයුතු කරමින් පවතින අතර පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී . |
| (ආ) | බඳවාගෙන තිබූ සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන්ට නියමිත රාජකාරී පැවරීමක් සිදු නොකිරීම හේතුවෙන් අදාල රාජකාරී ඉටුකරගැනීම සඳහා අදේශක පදනම මත නැවත සේවකයින් බඳවා ගැනීම නිසා සභාවට සමාලෝචිත වර්ෂය සඳහා රු.2,842,280 ක අතිරේක වැය බරක් දැරීමට සිදු වී තිබුණි. | නියමිත රාජකාරි පැවරීම් කළ යුතු වේ. | මේ වන විට සියළුම මාර්ග හා සෞඛ්‍ය කම්කරුවන් වෙත රාජකාරි පැවරීම් ලිපි නිකුත් කර ඇති අතර මාර්ග කම්කරුවන් සඳහා දෛනිකව පවරනු ලබන රාජකාරී විස්තරයන් ක්‍රමවත්ව සටහන් කරම. |
| (ඇ) | **සේවක ණය**<br>--------------<br>සමාලෝචිත වර්ෂය අවසානයට අය නොවී පවතින රු. 199,739 ක් වූ හිඟ ණය ශේෂඅයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වේ. | ණය ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර මෙය දීර්ඝ කාලයක් ගතවන කටයුත්තකි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 මාර්තු 20 දිනැති සැලසුම් කමිටු තීරණය මගින් අනුමත කර තිබූ අංක BA/2014/05 ගොඩනැගිලි සංවර්ධන බලපත්‍රයේ වාණිජ භාවිතය සඳහා වර්ග මීටර් 1306.93 ක සිව්මහල් ගොඩනැඟිලි සැලැස්මේ මෝටර් රථ නැවතුම් ස්ථාන 06 ක් පෙන්නුම් කර තිබුණද මෝටර් රථ නැවතුම් ස්ථාන 01 ක් සඳහා පමණක් ඉඩ වෙන්කර තිබුණි. නාගරික සංවර්ධන හා ප්‍රජා භූමි සංවර්ධන අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 17 හා අංක 1597/8 දරන ගැසට් පත්‍රයේ 05 ඡේදය පරිදි භාවිතය වෙනස් කිරීම වෙනුවෙන් නැවතුම් ස්ථාන එකකට රු.500,000 ක් බැගින් වාහන නැවතුම් ස්ථාන 05 ක් සඳහා රු.2,500,000 ක් අය කරගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වේ. | ගොඩනැඟිල්ලේ අයිතිකරු වෙත දන්වා ඇත. |
| (ආ) | අංක BA/2018/62 හා අංක BA/2014/05 සංවර්ධන බලපත්‍ර මගින් අනුමත කර තිබූ ගොඩනැගිලි සැලැසුම්වලට අනුකූල නොවන පරිදි සිදුකර තිබූ ගොඩනැඟිලි ඉදිකිරීම් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දින ගැසට් නිවේදනයේ v වන උප වගන්තියේ 6 (ii) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | දින 14 ක් ඇතුළත ඉදිකිරීම නීත්‍යානුකූල කර ගන්නා ලෙස අයිතිකරුට දන්වා ඇත . |

## 3.5 වත්කම් කළමණාකරණය

### 3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනවසරයෙන් පරිහරණය කරමින් පැවති සභාව සතු අක්කර 02 ක් වූ පැතුම්ගම නැමති ඉඩම සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වේ. | මෙම ඉඩමේ අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව සතු බැවින් ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව වෙතින් ඉල්ලීම් කර ඇත. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බස් නැවතුම්පොළ හා පිට්ටනිය අතර දැල්වැට ඉදිකිරීම සඳහා වැඩ විෂය 01 යටතේ Supplying & fixing 50X 50 P.V.C 5’ 11” height wire mesh (Gage 10) සඳහා වර්ග මීටර් 236.88 ක් සඳහා රු.940,887 ක් ගෙවීම් කර තිබූ නමුත්, එම වැඩ විෂයය යටතේ ඉටුකර තිබුණේ වර්ග මීටර් 201.06 ක් පමණි. ඒ අනුව වර්ග මීටර් 35.82 සඳහා රු.142,277 ක් (35.82 x 3972) වැඩිපුර ගෙවා තිබුණි. | ඉටු කල වැඩ කොටස්වල ප්‍රමාණයට ගෙවිය යුතු වේ. | රැඳවුම් මුදල වන රු.94,947 ක මුදල නිදහස් කර නොමැති අතර වැඩිපුර ගෙවා ඇති මුදල සඳහා එම මුදල හිලව් කර ගැනීමට කටයුතු කරමි. |